# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 51 දරන ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 දෙසැම්බර් මස 16 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 දෙසැම්බර් මස 16 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

## 2011 අංක 51 දරන ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2011 දෙසැම්බර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. සංස්. 3/2008.

### ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

“ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, පදනමේ පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල්, එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2011 අංක 51 දරන ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම” යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. එකී නාමයෙන්, ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම.

2-PL 005262-2,590 (2010/10)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාමය සහ ඊට අනුබද්ධ ශ්‍රී ධම්මාධාර මහ පිරිවෙන, ශ්‍රී ධම්මාධාර දහම් පාසල, රුවන් ළමා උයන නඩත්තු කිරීම ;

(ආ) ප්‍රදේශයේ දිළිඳු, අසරණ අය සඳහා නිවාස ඉදි කර දීම සහ අලුත්වැඩියා කරදීම ;

(ඇ) දිළිඳු, අසරණ රෝගීන්ට මුදල් ආධාර ලබා දීම සහ එවැනි තැනැත්තන් සඳහා උපකාර කිරීම පිණිස සායනික මධ්‍යස්ථාන ඉදිකිරීම, පිහිටුවීම සහ සැපයීම ;

(ඈ) මහජන යහපත සඳහා සංස්කෘතික, සමාජ, ආර්ථික සහ ආගමික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) දරු දැරියන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අවශ්‍ය උපකාර හා පුස්තකාල ඇති කිරීම, පාඨමාලා පැවැත්වීම, පහසුකම් සැපයීම ;

(ඊ) තරුණ තරුණියන්ගේ ක්‍රීඩා දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා ක්‍රීඩා උපකරණ සහ වෙනත් පහසුකම් ලබා දීම ;

(උ) අසරණ වැඩිහිටියන් සඳහා සහ ආබාධිත සහ අනාථ ළමයින් සඳහා නිවාස සැපයීම ;

(ඌ) ස්වාභාවික ආපදා අවස්ථාවන් හි දී තැනැත්තන්ට සහන සහ සුභසාධන ක්‍රියාමාර්ග සැලසීම ;

(එ) තරුණ තරුණියන්ට විදේශ රටවල උසස් අධ්‍යාපන කටයුතු සඳහා කාර්මික, තාක්ෂණික, විද්‍යා සහ ඉංජිනේරු යන අංශවලට ශිෂ්‍යත්ව පිරිනැමීම ;

(ඒ) දුප්පත් තැනැත්තන්ගේ විනෝදය සඳහා පහසුකම් ඇති කිරීම ; සහ

(ඔ) තරුණයන් සඳහා කාර්මික පුහුණුව ලබා දීම.

(2) සංස්ථාවේ ඉහත සඳහන් පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂ භේදය හෝ දේශපාලන මත පදනම්ව වෙනස්කමකට භාජනය නොකිරීමට වග බලා ගත යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබා ගැනීමේ ද, ආධාර මුදල් හෝ පරිත්‍යාග භාර ගැනීමේ හා එකතු කිරීමේ ද, ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරෙන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීමේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණ මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය. කළමනාකරණ මණ්ඩලය, (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම් විහාරාධිපතිවරයාගෙන් ද, එකී පදනමේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ 6 වන වගන්තිය යටතේ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන වෙනත් කමිටු සාමාජිකයන්ගෙන් ද සමන්විය විය යුතු ය.

(2) කළමනාකරණ මණ්ඩලයේ සෑම රැස්වීමකදී ම අධ්‍යක්ෂ ජනරාල්වරයා මුලසුන දැරිය යුතු ය. කළමනාකරණ මණ්ඩල රැස්වීමකට අධ්‍යක්ෂ ජනරාල්වරයා නොපැමිණියහොත්, සභාපතිවරයා එහි මුලසුන දැරිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට සහ එය යටතේ සාදන ලද රීතිවලට යටත්ව, රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ එහි කටයුතු කිරීම, කළමනාකරණ මණ්ඩලය විසින් පාලනය කළ යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත්කිරීමෙහිලා හෝ නම් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීම නිසා ම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(5) සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) මණ්ඩලයේ කාර්ය සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සඳහාත්, සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව දැක්වීම සඳහාත්, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම සඳහා සංස්ථාවේ මහ සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට අඩු නොවන ඡන්දයෙන් මිස, සංස්ථාවේ කිසිම රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකළ යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පැවරීම්, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලුම මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) කවර ආකාරයකින් හෝ ව්‍යුත්පන්න වූ සංස්ථාවේ මුදල් සහ දේපල, මෙහි දක්වා ඇති පරිදි අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් යොදා ගත යුතු අතර, එහි කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයකු වෙත ලාභාංශයක් වශයෙන් හෝ ප්‍රසාද දීමනාවක් වශයෙන් හෝ අන්‍යාකාරයකට ඍජුව ම හෝ වක්‍රව ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ සියලු ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පොත් තබා ගැනීමට සංස්ථාව කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරුවන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

පදනම විසින් ගෙවිය යුතු හෝ පදනමට අයවිය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනම විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.

10. යම් මිල දී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන කවර හෝ චංචල හෝ නිශ්චල දේපලක් අත් කර ගැනීමට, දැරීමට සංස්ථාවට නීතියෙන් බලය හා හැකියාව තිබෙන අතර, ඒ

සියලු දේපල 6 වන වගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීතිවලට යටත්ව ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් යම් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

11. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය සතුව තිබිය යුතු අතර, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු සහ ලේකම් හෝ කළමනාකරණ මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු ඉදිරිපිට දී මිස කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලැබූ අත්සනක්, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, ආයතනයකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.